# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2019 (පැරණි නිර්දේශය)

## 74 - පාලි

### ප්‍රශ්නපත්‍ර ව්‍යුහය සහ ලකුණු බෙදී යාම

## ලකුණු දීමේ පටිපාටිය

### ප්‍රශ්නපත්‍ර ව්‍යුහය

1 පත්‍රය : කාලය පැය 02 යි.

මෙම ප්‍රශ්න පත්‍රය වරණ පහ බැගින් වූ බහුවරණ ප්‍රශ්න 50 කින් සමන්විත ය. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් මුළු ලකුණු සංඛ්‍යාව 100 කි.

2 පත්‍රය : කාලය පැය 03 යි.

**I කොටස**

01. ප්‍රශ්නය

(i) නිවැරදි ගද්‍ය පරිවර්තනයට හිමි ලකුණු සංඛ්‍යාව 10 කි.

(ii) නිවැරදි පද්‍ය පරිවර්තනයට හිමි ලකුණු සංඛ්‍යාව 10 කි.

(ලකුණු 20 යි. )

02. ප්‍රශ්නය

(i) නිවැරදි ගද්‍ය පරිවර්තනයට හිමි ලකුණු සංඛ්‍යාව 10 කි.

(ii) එක් වැකියක් නිවැරදිව පාලියට පරිවර්තනය කිරීමට ලකුණු 02 බැගින් ලකුණු 10 කි.

(ලකුණු 20 යි. )

**II කොටස**

03. ප්‍රශ්නය

(i) එක් නිවැරදි පිළිතුරකට එක ලකුණ බැගින් ලකුණු 02 කි.

(ii) නිවැරදි පිළිතුරකට ලකුණු 02 බැගින් ලකුණු 04 කි.

(iii) සමස්ත පිළිතුරට හිමි ලකුණු සංඛ්‍යාව 06 කි.

(iv) එක් කොටසකට ලකුණු 04 බැගින් ලකුණු 08 කි.

(ලකුණු 20 යි. )

04. ප්‍රශ්නය

(i) එක් නිවැරදි පිළිතුරකට එක ලකුණ බැගින් ලකුණු 02 කි.

(ii) නිවැරදි පිළිතුරකට 01 ලකුණ බැගින් ලකුණු 04 කි.

(iii) එක් හැඳින්වීමකට ලකුණු 02 බැගින් ලකුණු 06 කි.

(iv) නිවැරදි පිළිතුරට හිමි ලකුණු සංඛ්‍යාව 08 කි.

(ලකුණු 20 යි. )

## III කොටස

05. ප්‍රශ්නය

(i) නිවැරදි එක් පිළිතුරකට ලකුණු භාගය බැගින් ලකුණු 05 කි.

(ii) නිවැරදි එක් පිළිතුරකට ලකුණු භාගය බැගින් ලකුණු 05 කි.

(iii) නිවැරදි එක් පිළිතුරකට එක ලකුණ බැගින් ලකුණු 05 කි.

(iv) නිවැරදි එක් පිළිතුරකට එක ලකුණ බැගින් ලකුණු 05 කි.

(ලකුණු 20 යි. )

06. ප්‍රශ්නය

(i) නිවැරදි පිළිතුරට හිමි ලකුණු සංඛ්‍යාව 05 කි.

(ii) නිවැරදි එක් පැහැදිලි කිරීමකට එක ලකුණ බැගින් ලකුණු 05 කි.

(iii) නිවැරදි එක් පැහැදිලි කිරීමකට එක ලකුණ බැගින් ලකුණු 05 කි.

(iv) නිවැරදි පිළිතුරට හිමි ලකුණු සංඛ්‍යාව 05 කි.

(ලකුණු 20 යි. )

**2 පත්‍රය සඳහා මුළු ලකුණු - 100 යි.**

**අවසාන ලකුණු ගණනය කිරීම : 1 පත්‍රය - 100**

**2 පත්‍රය - 100**

**අවසාන ලකුණු** - 200 / 2 = 100

# උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.
2. සෑම උත්තරපත්‍රයකම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ඉලක්කම් ලිවීමේදී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.
3. ඉලක්කම් ලිවීමේදී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා කෙටි අත්සන යොදන්න.
4. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමග □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

**උදාහරණ : ප්‍රශ්න අංක 03**

(i) ........................................................ √ △ $\frac{4}{5}$
........................................................
........................................................

(ii) ........................................................ √ △ $\frac{3}{5}$
........................................................
........................................................

(iii) ........................................................ √ △ $\frac{3}{5}$
........................................................
........................................................

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = □ $\frac{10}{15}$

## බහුවරණ උත්තරපත්‍ර : (කවුළු පත්‍රය)

1. අ.පො.ස. (උ.පෙළ) හා තොරතුරු තාක්ෂණ විභාගය සඳහා කවුළු පත්‍ර දෙපාර්තමේන්තුව මගින් සකසනු ලැබේ. නිවැරදි වරණ කපා ඉවත් කළ සහතික කරන ලද කවුළුපතක් ඔබ වෙත සපයනු ලැබේ. සහතික කළ කවුළු පත්‍රයක් භාවිත කිරීම පරීක්ෂකගේ වගකීම වේ.

2. අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.
3. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර 0 ලකුණකින් ද වරණ මත ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකටම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් අංක දෙකකින් ලියා දක්වන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය. I පත්‍රය සඳහා බහුවරණ පිළිතුරු පත්‍රයක් පමණක් ඇති විට ලකුණු ලැයිස්තුවට ලකුණු ඇතුළත් කිරීමෙන් පසු අකුරෙන් ලියන්න. අනෙකුත් උත්තරපත්‍ර සඳහා විස්තර ලකුණු ඇතුළත් කරන්න. 51 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර අකුරෙන් ද ලිවිය යුතු වේ.

***

AL/2019/74/S-T-E-I(OLD)

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

පැරණි නිර්දේශය/பழைய பாடத்திட்டம்/Old Syllabus

OLD

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

2019.08.09 / 0830 - 1030

පාලි I
பாளி I
Pali I

74 S-T-E I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ **ඔබේ විභාග අංකය** ලියන්න.
* උත්තර පත්‍රයේ පසු පිටේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (X) **යොදා දක්වන්න.**

**1.** පාලි භාෂාව හැඳින්වීමට පර්යාය නාමයක් **නො වන්නේ** මේවායින් කවරක් ද?
(1) මාගධීභාසා (2) තන්තිභාසා (3) ඉසිභාසා (4) මූලභාසා (5) පාවචන

**2.** වර්ගාක්ෂර **නොමැති** පදය තෝරන්න.
(1) අල්ලකෙසො (2) නමස්සති (3) සෙට්ඨි (4) හෙට්ඨිමං (5) අරියස්ස

**3.** පාලි ලේඛන රටාව අනුව නිවැරදිව ලියා ඇති පාඨය මෙයින් කුමක් ද?
(1) තස්මා හි භූතා නිශාමෙථ සබ්බෙ
(2) දෙවෙ ගළන්තම්හි නදන්ති දාඨිනො
(3) අඞ්ගීරසං පස්ස විරොචමානං
(4) භික්ඛූ ච පබ්භාරගතොව ධ්‍යායති
(5) තිණ්ණ මඤ්ඤතරං යාමං

**4.** **කෙරෙහි** යන අර්ථය දෙන නාම විභක්තිය කුමක් ද?
(1) සත්තමී (2) පඤ්චමී (3) චතුත්ථි (4) තතියා (5) ඡට්ඨී

**5.** '**ඉමං සාටං දදාමි තෙ**' යන වාක්‍යය සම්බන්ධයෙන් නිවැරදි ව්‍යාකරණ විග්‍රහය කුමක් ද?
(1) කර්තෘකාරක, වර්තමානකාලික, ප්‍රථමපුරුෂ වාක්‍යයකි.
(2) කර්තෘකාරක, අනාගතකාලික, ප්‍රථමපුරුෂ වාක්‍යයකි.
(3) කර්තෘකාරක, වර්තමානකාලික, උත්තමපුරුෂ වාක්‍යයකි.
(4) කර්මකාරක, වර්තමානකාලික, උත්තමපුරුෂ වාක්‍යයකි.
(5) කර්මකාරක, අතීතකාලික, මධ්‍යමපුරුෂ වාක්‍යයකි.

● පහත දැක්වෙන ඡේදය කියවා **6** සිට **10** තෙක් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

අථඛො සුරියකුමාරො තං සරං ගන්ත්වා අවීමංසිත්වාව ඔතරි. අථ නං සො රක්ඛසො ගහෙත්වා දෙවධම්මං ජානාසීති පුච්ඡි. සො දෙවධම්මා නාම චන්දසුරියාති ආහ. අථ නං ත්වං දෙවධම්මෙ න ජානාසීති උදකං පවෙසෙත්වා අත්තනො වසනට්ඨානෙ ඨපෙසි. බොධිසත්තොපි තං චිරායන්තං දිස්වා චන්දකුමාරං පෙසෙසි. රක්ඛසො තම්පි ගහෙත්වා දෙවධම්මෙ ජානාසීති පුච්ඡි. ආම ජානාමි, දෙවධම්මා නාම චතස්සො දිසාති. රක්ඛසො න ත්වං දෙවධම්මෙ ජානාසීති තම්පි ගහෙත්වා තථෙව ඨපෙසි. බොධිසත්තො තස්මිම්පි චිරායන්තෙ එකෙන අන්තරායෙන භවිතබ්බන්ති සයං තත්ථ ගන්ත්වා ද්වින්නම්පි ඔතරණපදවළඤ්ජං දිස්වා රක්ඛසපරිග්ගහෙන ඉමිනා සරෙන භවිතබ්බන්ති ඛග්ගං සන්නය්හිත්වා ධනුං ගහෙත්වා අට්ඨාසි.

**6.** කො දෙවධම්මං පරියෙසති?
(1) බොධිසත්තො (2) චන්දකුමාරො (3) සුරියකුමාරො
(4) රක්ඛසො (5) චන්දසුරියා

AL/2019/74/S-I-E-I(OLD)

7. '**බොධිසත්තො කිං ගහෙත්වා අට්ඨාසි**?' යන ප්‍රශ්නයට වඩාත් ගැළපෙන පිළිතුර කුමක් ද?
(1) දෙවධම්මං (2) චන්දකුමාරං (3) රක්ඛසං (4) ධනුං (5) උදකං

8. රාක්ෂසයාගේ ප්‍රශ්නයට චන්ද කුමාරයා දුන් පිළිතුර මෙයින් කුමක් ද?
(1) මව සහ පියා (2) හිරි සහ ඔතප් (3) හිරු සහ සඳු
(4) කඩු සහ දුනු (5) සිවු දිශා

9. 'ගිය මඟ සලකුණු' යන අදහස දීමට මෙම ඡේදයෙහි යෙදෙන පාලි වචනය වන්නේ මෙයින් කවරක් ද?
(1) අවීමංසිත්වා (2) ඔතරණපදවළඤ්ජං (3) චිරායන්තං
(4) පවෙසෙත්වා (5) රක්ඛසපරිග්ගහෙන

10. **වසනට්ඨානෙ** යන්න
(1) සන්ධියකි. (2) සමාසයකි. (3) තද්ධිතයකි. (4) කිතකයකි. (5) ආඛ්‍යාතයකි.

11. '**අත්තානමෙව පඨමං-පතිරූපෙ නිවෙසයෙ...**' යනාදි ගාථාවේ අවසාන පාදය මෙයින් කවරක් ද?
(1) අත්තා හි කිර දුද්දමො (2) යථා නං ඉච්ඡති දිසො
(3) පටිජග්ගෙය්‍ය පණ්ඩිතො (4) න කිළිස්සෙය්‍ය පණ්ඩිතො
(5) පතිරූපෙ නිවෙසයෙ

12. අට්ඨකථාචාර්ය බුද්ධඝෝෂ හිමියන්ගේ ගුරුවරයාගේ නම,
(1) බුද්ධදත්ත හිමි ය. (2) සංඝමිත්ත හිමි ය.
(3) නාගසේන හිමි ය. (4) සෝභිත හිමි ය.
(5) රේවත හිමි ය.

13. '**තස්මිං සමාගමෙ සංඝං ඉදමාහ මහීපති**' යන්නෙහි වඩාත් නිවැරදි අන්වය තෝරන්න.
(1) තස්මිං සමාගමෙ මහීපති ඉදමාහ සංඝං (2) ඉදමාහ සංඝං තස්මිං සමාගමෙ මහීපති
(3) මහීපති තස්මිං සමාගමෙ සංඝං ඉදමාහ (4) තස්මිං මහීපති සංඝං සමාගමෙ ඉදමාහ
(5) තස්මිං සමාගමෙ සංඝං ඉදමාහ මහීපති

14. **අසමාන** වරණය තෝරන්න.
(1) බයං, විරාගං, අමතං, පණීතං (2) වදාමි, භාසාමි, කථෙමි, පකාසෙමි
(3) උදකං, දකං, ජලං, වාරිං (4) බුද්ධො, තථාගතො, සක්‍යමුනි, භගවා
(5) කාම, දිට්ඨි, සීලබ්බත, අත්තවාද

15. **උක්කාසිතසද්දො** යන්නෙන් අදහස් වන්නේ කුමක් ද?
(1) කිවිසීම (2) උගුර පෑදීම (3) ගොරවන ශබ්දය
(4) අකුණු ගැසීම (5) ආයුධ ශබ්දය

16. බෞද්ධ භාවනාව පිළිබඳ ව ඉගැන්වෙන සූත්‍රයක් වන්නේ මෙයින් කවරක් ද?
(1) ආටානාටිය (2) පායාසි රාජඤ්ඤ
(3) මහාසමය (4) මහාසතිපට්ඨාන
(5) බ්‍රහ්මජාල

17. **ධම්මික සූත්‍රය** ඇතුළත් ත්‍රිපිටක ග්‍රන්ථය දැක්වෙන වරණය තෝරන්න.
(1) බුද්දකපාඨ (2) උදානපාළි (3) සුත්තනිපාත (4) ඉතිවුත්තක (5) ජාතකපාළි

18. කර්මකාරක වාක්‍යයක් වන්නේ මේවායින් කුමක් ද?
(1) සෙට්ඨිනා බහුන්නං යාචකානං දානං දීයති.
(2) ඉමෙ පඤ්ච දාරකා අභිණ්හං මග්ගෙ කීළන්ති.
(3) යෙ පාපානි කරොන්ති තෙ නිරයෙ නිබ්බත්තිස්සන්ති.
(4) දාසියා මාතා ධෙනුං රජ්ජුයා බන්ධිත්වා ආනෙසි.
(5) පණ්ඩිතවාණිජො අහමෙව අභොසින්ති දෙසනං නිට්ඨපෙසි.

19. **ලොකජෙට්ඨො** යන පදය අයත් වන්නේ කවර සමාසයට ද?
(1) කම්මධාරය (2) තප්පුරිස (3) ද්වන්ද (4) දිගු (5) අබ්‍යයීභාව

[See page eight/Please turn over]

**20.** මහාවංසය අනුව නිවැරදි ප්‍රකාශයක් **නො වන්නේ** මෙයින් කුමක් ද?
(1) දෙවනපෑතිස් රජතුමා විසින් මිරිසවැටි (මරිචවට්ටි) විහාරය කරවන ලදී.
(2) ථේරපුත්තාභය යෝධයා පසු කලෙක පැවිදි වී රහත් විය.
(3) රජුගේ කුන්තය ආරක්ෂා කිරීමට 'කුන්තධරක'යැයි නිලධාරී පිරිසක් වූහ.
(4) මිරිසවැටි (මරිචවට්ටි) විහාරය ඉදිකිරීමට ගත වූ කාලය වර්ෂ තුනකි.
(5) තිස්ස වැව පිහිටියේ අනුරාධපුරයේ ය.

**21.** වණ්ණුපථ ජාතකයේ සඳහන් '**සත්ථාරා චත්තාරො පුග්ගලා කථිතා...**' යන ප්‍රකාශයට අදාළ වන්නේ පහත දැක්වෙන කවර වරණය ද?
(1) අඤ්ඤදත්ථුහර, වචීපරම, අනුප්පියභාණී, අපායසහාය
(2) අගාරියමුනි, අනගාරියමුනි, සෙඛමුනි, අසෙඛමුනි
(3) සොතාපන්න, සකදාගාමි, අනාගාමි, අරහන්ත
(4) උග්ඝටිතඤ්ඤූ, විපඤ්චිතඤ්ඤූ, ඤෙය්‍ය, පදපරම
(5) උදකදායකො, චූලුපට්ඨාකො, ඔස්සට්ඨවිරියො, සත්ථවාහජෙට්ඨකො

**22.** '**සාමි, එකො පුත්තො ජාතො, ඉදානි කිං කරිස්සාම**' මෙය ප්‍රකාශ කරන ලද්දේ,
(1) සේරිවාණිජ ජාතකයේ සඳහන් වන කුඩා දැරිය විසිනි.
(2) චුල්ලසෙට්ඨි ජාතකයේ සඳහන් වන සිටු දියණිය විසිනි.
(3) දේවධම්ම ජාතකයේ සඳහන් වන රාක්ෂසයා විසිනි.
(4) ථෙරීගාථාවන්හි සඳහන් වන පුණ්ණා දාසිය විසිනි.
(5) වණ්ණුපථ ජාතකයේ සඳහන් වන ගැල්කරුවන් විසිනි.

**23.** ශබ්දානුප්‍රාස රසයෙන් වඩාත් උසස් ගාථා පාදය තෝරන්න.
(1) අබ්‍රහ්මචරියං පරිවජ්ජයෙය්‍ය, අංගාරකාසුං ජලිතංව භික්ඛූ
(2) අත්තා හි අත්තනො නාථො, කො හි නාථො පරො සියා
(3) යදා නභෙ ගජ්ජති මෙඝදුන්දුභි, ධාරාකුලා විහගපථෙ සමන්තතො
(4) යානීධ භූතානි සමාගතානි, භුම්මානි වා යානි ව අන්තලික්ඛෙ
(5) පාදෙ පතිට්ඨපෙත්වාපි, ජලෙ අභයවාපියා

**24.** ග්‍රන්ථ කතුවරයාට අනුව මහාවංසය රචනා කිරීමෙහි පොදු අරමුණ වී ඇත්තේ,
(1) අනාගතය සඳහා ඉතිහාසය ලියා තැබීමයි.
(2) පාලි භාෂාවෙන් කාව්‍ය ග්‍රන්ථයක් රචනා කිරීමයි.
(3) ශ්‍රී ලාංකිකයන්ගේ ජාතිකාභිමානය වර්ධනය කිරීමයි.
(4) සත්පුරුෂයන් තුළ ප්‍රසාදය හා සංවේගය ජනනය කිරීමයි.
(5) ශාසන ඉතිහාසය වාර්තා කිරීමයි.

**25.** **සාමඤ්ඤඵල සූත්‍රය** අයත් වන්නේ කවර නිකාය ග්‍රන්ථයට ද?
(1) දීඝනිකාය (2) මජ්ඣිමනිකාය.
(3) සංයුත්තනිකාය (4) අංගුත්තරනිකාය
(5) ඛුද්දකනිකාය

**26.** බුද්ධ වචනය ඡන්දසට නැඟීමට අවසර ඉල්លූ භික්ෂූන් දෙදෙනා වන්නේ,
(1) අස්සජි - පුනබ්බසුක ය. (2) සාරිපුත්ත - මොග්ගල්ලාන ය.
(3) සබ්බකාමී - යස ය. (4) මහාකොට්ඨිත - මහාකච්චායන ය.
(5) යමෙළු - තෙලුක ය.

**27.** උපතිස්ස නම් යතිවරයකු විසින් රචිත පාලි ග්‍රන්ථයක් වන්නේ මෙයින් කුමක් ද?
(1) දාඨාවංසය (2) ථූපවංසය
(3) මහාබෝධිවංසය (4) රසවාහිනිය
(5) කථාවත්ථුව

AL/2019/74/S-I-E-I(OLD)

**28.** දොළහ, තිස්තුන, අනූ නවය යන සංඛ්‍යා නිවැරදිව පාලියෙන් ලියා ඇති වරණය තෝරන්න.
(1) බාරස, තිංසති, නවනවුති
(2) ද්වාදස, තෙත්තිංසති, එකූනසත
(3) ද්වාදසමො, තෙතිංසතිමො, නවනවුතිමො
(4) ද්වාදස, තෙරස, එකූනසත
(5) ද්වාදසමො, වීසති, එකූනසත

**29.** **ගච්ඡන්ත** ශබ්දයේ ඡට්ඨී බහුවචන රූපයක් වන්නේ මෙයින් කුමක් ද?
(1) ගච්ඡතං (2) ගච්ඡන්තස්ස (3) ගච්ඡතො (4) ගච්ඡන්තං (5) ගච්ඡති

**30.** **ඕතො** යන්න
(1) සමාසයකි. (2) තද්ධිතයකි. (3) ආඛ්‍යාතයකි. (4) කාරකයකි. (5) කිතකයකි.

**31.** '**මාකාසි පාපකං කම්මං**, .........' යන්නෙහි හිස්තැනට නිර්දිෂ්ට ග්‍රන්ථයේ යෙදී ඇති පාඨය තෝරන්න.
(1) ආවී වා යදි වා රහො
(2) මා තෙ සීතං ඡවිං හනෙ
(3) සචෙ තෙ දුක්ඛමප්පියං
(4) කරිස්සසි කරොසි වා
(5) උපෙමි සරණං බුද්ධං

**32.** **උදයබ්බයං** යන්නෙන් ප්‍රකාශ වන්නේ කුමක් ද?
(1) උදේ සහ හවස
(2) අලුයම ඇති වූ බිය
(3) ඇතිවීම සහ නැතිවීම
(4) හිරු බැසයාම
(5) දිය පොකුණ

**33.** **සොත්ථියො වම්හි** යන්නෙහි නිවැරදි පද බෙදීම කුමක් ද?
(1) සො ථියො ච අම්හි
(2) සොත්ථි යො ච අම්හි
(3) සොත්ථියො ච අම්හි
(4) සු අත්ථි යො වම්හි
(5) සොත්ථියොච අම්හි

**34.** නවංගසත්ථුසාසනයට අයත් **නො වන්නේ** මේවායින් කවරක් ද?
(1) ගෙය්‍ය (2) වෙය්‍යාකරණ (3) වෙදල්ල (4) අබ්භුතධම්ම (5) නිද්දෙස

**35.** පච්චුප්පන්නවත්ථු, අතීතවත්ථු, ගාථා, වෙය්‍යාකරණ සහ සමොධාන යන කරුණු පිළිවෙළින් දක්වා ඇත්තේ,
(1) ජාතකට්ඨකථාවේ ය.
(2) ධම්මපදට්ඨකථාවේ ය.
(3) චරියාපිටකට්ඨකථාවේ ය.
(4) උදානට්ඨකථාවේ ය.
(5) රසවාහිනියේ ය

**36.** සංයුත්ත නිකායේ ඇතුළත් සූත්‍ර සංඛ්‍යාව නිවැරදිව දැක්වෙන වරණය තෝරන්න.
(1) 152 (2) 7752 (3) 8000 (4) 9556 (5) 10000

**37.** **පුත්තදාරා** යනු,
(1) පුත්‍රයන් හා දියණියන් ය.
(2) පුතා හා මුනුබුරා ය.
(3) පුතා හා දියණිය ය.
(4) දරුවන් හා මුනුබුරන් ය.
(5) දරුවන් හා බිරිඳ ය.

**38.** **සත්තාහං** යන්න අයත් වන්නේ කවර සමාස ප්‍රභේදයට ද?
(1) කම්මධාරය (2) තප්පුරිස (3) ද්වන්ද (4) දිගු (5) බහුබ්බීහි

**39.** සංස්කෘත ආභාසය වැඩියෙන් ම ලැබී ඇතැයි සැලකෙන ග්‍රන්ථය මෙයින් කවරක් ද?
(1) දාඨාවංසය
(2) හත්ථවනගල්ලවිහාරවංසය
(3) ථූපවංසය
(4) සහස්සවත්ථුප්පකරණය
(5) ජිනචරිතය

[ අනෙක් පිටුව බලන්න/மறுபக்கம் பார்க்க/Please turn over

**40.** රහතන් වහන්සේලා හැඳින්වීමට පර්යාය නාමයක් වශයෙන් **නො යෙදෙන** පදය තෝරන්න.
(1) අවිරූළ්හිච්ඡන්දා (2) ඛීණබීජා (3) සෙඛා
(4) ඛීණාසවා (5) ධීරා

**41.** සත්තමී අර්ථයෙහි දුතියා විභක්තිය යෙදී ඇති බවට නිදසුනක් වන්නේ කවර වරණය ද?
(1) එකං සමයං භගවා (2) එකස්මිං සමයෙ භගවා
(3) තෙන ඛො පන සමයෙන භගවා (4) තස්මිං සමයෙ භගවා
(5) තදා භගවා

**42.** '**එලානි කට්ඨකස්සෙව, අත්තඝඤ්ඤාය ඵල්ලති**' මෙම කියමනට වඩාත් යෝග්‍ය ගැළපීම සහිත වරණය තෝරන්න.
(1) ඇතැම් මව්පියන් නිසා දරුවෝ නොමඟ යති.
(2) ඇතැම් මව්පියන් නිසා දරුවෝ නිසි මඟ යති.
(3) ඇතැම් දරුවන් නිසා මව්පියෝ නොමඟ යති.
(4) ඇතැම් දරුවන් නිසා මව්පියෝ නිසි මඟ යති.
(5) ඇතැම් හේතු නිසා මව්පියෝ මෙන්ම දරුවෝ ද නොමඟ යති.

**43.** 'මාලුවා සාලමිවොතතං' යන පාඨයෙහි '**මාලුවා**' යනු,
(1) ගසකි. (2) වැලකි. (3) මලකි. (4) ගෙඩියකි. (5) සතෙකි.

**44.** **මාරයා** යන්නට සුදුසු **නොවන** පාලි වචනය මෙයින් කවරක් ද?
(1) මාරො (2) අන්තකො (3) මච්ඡකො (4) කාලො (5) මච්චු

**45.** බුදුරදුන් කොසොල් රටවැසියකු බව සඳහන් වන සූත්‍රයක් වන්නේ මෙයින් කවරක් ද?
(1) ධම්මචක්කප්පවත්තන (2) මූලපරියාය
(3) මහාපරිනිබ්බාණ (4) ධම්මචෙතිය
(5) අනත්තලක්ඛණ

**46.** **කිං තෙ තාත කත්වා ඉදං ධනං ලද්ධං**? යන්නෙහි නිවැරදි අරුත වන්නේ මෙයින් කුමක් ද?
(1) දරුව, ඔබ මේ ධනය ලබන ලද ද?
(2) දරුව, කුමකට ඔබ මේ ධනය ලැබුවෙහි ද?
(3) දරුව, ඔබ විසින් කුමක් කොට මේ ධනය ලබන ලද ද?
(4) දරුව, ලබන ලද ධනයට ඔබ කුමක් කරන්නෙහි ද?
(5) දරුව, ඔබ මේ ධනය ලබන්නට කැමති ද?

**47.** **මහාකස්සපචරිත** නම් කෘතියේ කර්තෘවරයා වන්නේ,
(1) පොල්වත්තේ බුද්ධදත්ත නාහිමි ය. (2) පඤ්ඤාසාමි කවිධජ නාහිමි ය.
(3) යගිරල පඤ්ඤානන්ද නාහිමි ය. (4) විදුරුපොල පියතිස්ස නාහිමි ය.
(5) දිඹුලාගල කාශ්‍යප නාහිමි ය.

**48.** **මහාවංසයට** යෙදෙන අපර නාමයක් වන්නේ මින් කුමක් ද?
(1) පජ්ජපදොරුවංස (2) වංසත්ථප්පකාසිනී
(3) අභිධානප්පදීපිකා (4) වංසත්ථදීපනී
(5) සීහළවත්ථුප්පකරණ

**49.** **අත්ථසාලිනිය** කවර අභිධර්ම ග්‍රන්ථයක අටුවාවක් වේ ද?
(1) ධම්මසංගණිප්පකරණය (2) කථාවත්ථුප්පකරණය (3) විභංගප්පකරණය
(4) පට්ඨානප්පකරණය (5) ධාතුකථාප්පකරණය

**50.** බෞද්ධ ඉගැන්වීම අනුව ලෞකික ජීවිතයක් අර්ථවත් වීමට වඩාත් අවශ්‍ය වන්නේ පහත දැක්වෙන කවර ගුණ යුගලය ද?
(1) අලෝභ - අදෝස (2) සුඛ - දුක්ඛ (3) සීල - සමාධි
(4) හිරි - ඔතප්ප (5) කරුණා - පඤ්ඤා

* * *

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

## අ.පො.ස. (උ.පෙළ) විභාගය/ க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2019

## පැරණි නිර්දේශය/ பழைய பாடத்திட்டம்

| විෂයය අංකය<br>பாட இலக்கம் | 74 | විෂයය<br>பாடம் | පාලි |
|---|---|---|---|

## ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்

### I පත්‍රය/பத்திரம் I

| ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. | 3 | 11. | 4 | 21. | 4 | 31. | 1 | 41. | 1 |
| 02. | 5 | 12. | 5 | 22. | 2 | 32. | 3 | 42. | 3 |
| 03. | 2 | 13. | 3 | 23. | 3 | 33. | 3 | 43. | 2 |
| 04. | 1 | 14. | 5 | 24. | 4 | 34. | 5 | 44. | 3 |
| 05. | 3 | 15. | 2 | 25. | 1 | 35. | 1 | 45. | 4 |
| 06. | 4 | 16. | 4 | 26. | 5 | 36. | 2 | 46. | 3 |
| 07. | 4 | 17. | 3 | 27. | 3 | 37. | 5 | 47. | 4 |
| 08. | 5 | 18. | 1 | 28. | 2 | 38. | 4 | 48. | 1 |
| 09. | 2 | 19. | 2 | 29. | 1 | 39. | 2 | 49. | 1 |
| 10. | 1 | 20. | 1 | 30. | 5 | 40. | 3 | 50. | 4 |

✪ විශේෂ උපදෙස්/ விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට/ ஒரு சரியான விடைக்கு 02 ලකුණු බැගින්/புள்ளி வீதம்
මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் 2 × 50 = 100

## I කොටස

**1. සිංහලට** නගන්න.

(i) අතීතෙ කාසිරට්ඨෙ බාරාණසියං බ්‍රහ්මදත්තො රාජා අහොසි. තදා අම්හාකං බොධිසත්තො තස්ස අග්ඝකාරකො අහොසි. හත්ථිඅස්සාදීනි චෙව මණිසුවණ්ණාදීනි ච අග්ඝාපෙසි. අග්ඝාපෙත්වා භණ්ඩසාමිකානං භණ්ඩානුරූපමෙව මූලං දාපෙසි. රාජා පන ලුද්ධො හොති. සො ලොභපකතිතාය එවං චින්තෙසි. අයං අග්ඝාපනකො එවං අග්ඝාපෙන්තො න චිරස්සෙව මම ගෙහෙ ධනං පරික්ඛයං ගමෙස්සති, අඤ්ඤං අග්ඝාපනකං කරිස්සාමීති. සො සීහපඤ්ජරං උග්ඝාටෙත්වා රාජංගණං ඔලොකෙන්තො එකං ගම්කමනුස්සං ලොලබාලං රාජංගණෙන ගච්ඡන්තං දිස්වා එස මය්හං අග්ඝාපනකකම්මං කාතුං සක්ඛිස්සතීති තං පක්කොසාපෙත්වා සක්ඛිස්සසි භණෙ අම්හාකං අග්ඝාපනිකකම්මං කාතුන්ති ආහ. සක්ඛිස්සාමි දෙවාති. රාජා අත්තනො ධනරක්ඛනත්ථාය තං බාලං අග්ඝාපනියකම්මෙ ඨපෙසි. (ලකුණු 10යි.)

(i) **ආදර්ශ පරිවර්තනය.**

අතීතයේ කසීරට බරණැස බ්‍රහ්මදත්ත නම් රජෙක් විය. එකල අපගේ බෝසත් තෙම ඔහුගේ මිල තක්සේරු කරන්නා විය. ඇත්, අස් ආදීන් මෙන් ම මැණික් රන් ආදිය ද මිල නියම කරවීය. මිල නියමෙ කොට බඩු හිමියන්ට බඩුවලට සුදුසු ම මුදල දෙවී ය. රජු වනාහී ලෝභී වූයේ වෙයි. හෙතෙම ලෝභ ගතිය ඇති නිසා මෙසේ සිතී ය. මේ මිල නියමකරන්නා මෙසේ මිල නියම කරමින් නොබෝ කලකින් ම මගේ ගෙයි ධනය ඉතා ක්‍ෂය වීමට යවන්නේ ය. අන් අයෙකු තක්සේරුකරු කරන්නෙමි යනුවෙනි. හෙතෙම සී මැදුරු කවුළුව හැර රජමිදුල බලන්නේ රජමිදුලෙන් යන එක් ලෝභී - නැණ හීන ගැමි මිනිසෙකු දැක මොහු මගේ තක්සේරු කටයුතු කරන්නට හැකි වන්නේ යැයි ඔහු කැඳවා බොල, මගේ තක්සේරු කටයුතු කරන්නට හැකි වන්නෙහිදැයි කීය. රජතුමනි, හැකි වන්නෙමි යනුවෙනි. රජතෙමේ තමාගේ ධනය රැකීම පිණිස ඒ අඥානයා තක්සේරු කටයුත්තෙහි තැබී ය.

(ii) උදකමොතරිං සීතෙ, සදා උදකමාහරිං,
අය්‍යානං දණ්ඩභයභීතා, වාචාදොසභයට්ටිතා.
කස්ස බ්‍රාහ්මණ ත්වං භීතො, සදා උදකමොතරි,
වෙධමානෙහි ගත්තෙහි, සීතං වෙදයසෙ භුසං.
ජානන්තී වත මං හොතී, පුණ්ණිකෙ පරිපුච්ඡසි,
කරොන්තං කුසලං කම්මං, රුන්ධන්තං කතපාපකං.
යො ච වුද්ධො ච දහරො වා, පාපකම්මං පකුබ්බති,
දකාභිසෙචනා සොපි, පාපකම්මා පමුච්චති. (ලකුණු 10යි.)

(ii) **ආදර්ශ පරිවර්තනය.**

- ★ (මම) හැමදා ස්වාමින්ගේ දඬුවම් බියෙන් බියපත් වූවා, වචන දෝෂ බියෙන් පෙළුණි. සීත කාලයෙහි දියට බැස්සෙමි. දිය ගෙනාවෙමි.
- ★ බමුණ, නුඹ කවරෙකුට බිය වූයේ හැම කල්හි දියට බැස්සෙහි ද ? වෙව්ලන සිරුරෙන් යුතුව බොහෝ සේ ශීත විඳින්නෙහි ද?
- ★ පින්වත් පුණ්ණාවනි, කළ පව්කම් වළක්වන, කුශලකර්ම කරන්නා වූ, මා ගැන ඒකාන්තයෙන් දන්නීම විචාරහි.
- ★ යම් මහල්ලෙක් හෝ දරුවෙක් හෝ පාපකර්ම කරයි ද, ඔහු ද ජල ස්නානයෙන් පාපකර්මයෙන් මිදේ.

**ලකුණු දීමේ ක්‍රමය.**

(i) පාඨ්‍යය සිංහලට නැගීමේ දී නිවැරදි අර්ථ අවබෝධය සඳහා ලකුණු අටක් ද, එහි නිවැරදි සිංහල ව්‍යාකරණය සඳහා ලකුණු දෙකක් ද පිරිනමන්න. දුෂ්කර පද අත්හරිමින් හා මනඃකල්පිතව කර ඇති පරිවර්තන සඳහා සුදුසු පරිදි ලකුණු අඩු කරන්න.

(ii) කොටසට ලකුණු දීමේ දී එක් ගාථාවකට ලකුණු දෙක හමාර බැගින් සලකා පළමු පාඨ්‍යයට ලකුණු ප්‍රදානය කළ ආකාරයට ලකුණු දිය යුතු ය.

---

**2.** (i) **සිංහලට** නගන්න.

රාජගහෙ කිර ධනසෙට්ඨිකුලස්ස ධීතා අත්තනො දාසෙනෙව සද්ධිං සන්ථවං කත්වා අඤ්ඤෙපි මෙ ඉමං කම්මං ජානෙය්‍යුන්ති භීතා එවමාහ. අම්හෙහි ඉමස්මිං ඨානෙ වසිතුං න සක්කා. සචෙ මෙ මාතාපිතරො ඉමං දොසං ජානිස්සන්ති, ඛණ්ඩාඛණ්ඩං කරිස්සන්ති, විදෙසං ගන්ත්වා වසිස්සාමා'ති හත්ථසාරං ගහෙත්වා අග්ගද්වාරෙන නික්ඛමිත්වා යත්ථ වා තත්ථ වා අඤ්ඤෙහි අජානනට්ඨානං ගන්ත්වා වසිස්සාමා'ති උභොපි අගමංසු. තෙසං එකස්මිං ඨානෙ වසන්තානං සංවාසමන්වාය තස්සා කුච්ඡියං ගබ්භො පතිට්ඨාසි. සා ගබ්භපරිපාකමාගම්ම සාමිකෙන සද්ධිං මන්තෙසි. ගබ්භො මෙ පරිපාකං ගතො. ඤාතිබන්ධුවිරහිතෙ ච ඨානෙ ගබ්භවුට්ඨානං නාම උභින්නම්පි අම්හාකං දුක්ඛමෙව, කුලගෙහං ගච්ඡාමා'ති. සො අජ්ජ ගච්ඡාම ස්වෙ ගච්ඡාමා'ති දිවසෙ අතික්කාමෙසි. සා චින්තෙසි: අයං බාලො අත්තනො දොසමහන්තතාය ගන්තුං න උස්සහති. මාතාපිතරො නාම එකන්තහිතා. අයං ගච්ඡතු වා මා වා මයා ගන්තුං වට්ටතී'ති (ලකුණු 10යි.)

(i) **ආදර්ශ පරිවර්තනය.**

රජගහනුවර වනාහී ධනවත් සිටු කුලයක දියණියක් තමාගේ දාසයා සමග සංවාසය කොට අන්‍යයෝ ද මාගේ මේ ක්‍රියාව දැන ගන්නාහු යැයි බියපත්ව මෙසේ කීවා ය. අප විසින් මෙතැන වසන්නට නො හැකි ය. ඉදින් මගේ මව්පියෝ මේ දෝෂය (වරද) දැනගන්නාහු නම් කෑලි කෑලි කරන්නාහ. විදේශයකට ගොස් වාසය කරන්නෙමු යි හස්තසාර වස්තුව ගෙන ප්‍රධාන දොරටුවෙන් නික්ම කොහේ හෝ අන්‍යයන් විසින් නො දන්නා තැනකට ගොස් වසන්නෙමුයි දෙදෙනාම ගියහ. එක්තැනක වසන්නා වූ ඔවුන්ගේ එක්ව විසීම හේතු කොට ගෙන ඇගේ කුසෙහි දරුගැබක් පිහිටියේය. ඕ තොමෝ ගැබ මේරීමට පැමිණ ස්වාමියා සමඟ මන්ත්‍රණය කළා ය. මාගේ ගැබ මෝරා ගියේය. නෑ හිතවතුන් නොමැති තැනක දරු ප්‍රසූතිය නම් අප දෙදෙනාට ම දුකක්ම ය. කුලගෙයට යමු, යනුවෙනි. හෙතෙම අද යමු. හෙට යමු යැයි දවස් ගෙවී ය. ඈය සිතුවාය. අනුවණයා තමාගේ වරද මහත් බැවින් යාමට උත්සාහ නො කරයි. මව්පියෝ නම් ඒකාන්තයෙන් ම හිතවත්හු ය. මොහු යේවා හෝ නො යේවා හෝ මා යන්නට වටී යනුවෙනි.

(ii) **පාලියට** නගන්න.

(අ) ගෘහපතියෝ බුදුරදුන් යම් තැනක ද එතැනට එළඹිය හ.

(ආ) තාපසයෝ පර්වතයෙන් ගමට පැමිණියහ.

(ඉ) වෙළෙන්දෝ ගමේ මිනිසුන් සමග නගරයට යති.

(ඊ) පක්ෂීහු ගසෙන් අහසට ඉගිල ගියහ.

(උ) රජවරු දැහැමිව රට පාලනය කෙරෙත්වා! (ලකුණු 10යි.)

(ii) **ආදර්ශ පරිවර්තනය.**

(අ) ගහපතයො යෙන භගවා තෙනුපසංකමිංසු.

(ආ) තාපසා පබ්බතම්හා ගාමං ආගච්ඡිංසු.

(ඉ) වාණිජා ගාමෙ මනුස්සෙහි සද්ධිං නගරං ගච්ඡන්ති.

(ඊ) සකුණා පබ්බතම්හා ආකාසං උඩ්ඩෙසුං.

(උ) රාජානො ධම්මෙන රට්ඨං පාලයන්තු.

**ලකුණු දීමේ ක්‍රමය.**

(i) පාඨය සිංහලට නැගීමේ දී නිවැරදි අර්ථ අවබෝධය සඳහා ලකුණු අටක් ද, එහි නිවැරදි සිංහල ව්‍යාකරණය සඳහා ලකුණු දෙකක් ද පිරිනමන්න. දුෂ්කර පද අත්හරිමින් හා මනඃකල්පිතව කර ඇති පරිවර්තන සඳහා සුදුසු පරිදි ලකුණු අඩු කරන්න.

(ii) කොටසට ලකුණු දීමේ දී නිවැරදි එක් වාක්‍යයකට ලකුණු **දෙක** බැගින් හිමි වේ. **දෝෂ එකක්** ඇත්නම් වාක්‍යයකට උපරිමය ලකුණු **එකකි.** දෝෂ එකකට වඩා ඇත්නම් ලකුණු හිමි නො වේ. සමස්තයේ වචන භාවිතය සලකා ලකුණු දෙන්නේ නම් ලකුණු 04 උපරිමය ලෙස සලකන්න.

## II කොටස

3. (i) ප්‍රථම සංගීතියට මූලිකත්වය හා දායකත්වය සැපයූ ඓතිහාසික පුද්ගල යුගලය නම් කරන්න.

(ii) පාලි භාෂාවෙහි ප්‍රභවය සම්බන්ධයෙන් දක්වා ඇති වියත් මත **දෙකක්** පෙන්වා දෙන්න.

(iii) සුත්ත, විනය හා අභිධම්ම යන වචන නිර්වචනය කරන්න.

(iv) දීඝනිකාය හා මජ්ඣිමනිකායට අයත් සූත්‍ර හතර බැගින් වෙන වෙන ම ලියා දක්වන්න.

(ලකුණු 2+4+6+8=20 යි.)

ආදර්ශ පිළිතුර

(i) මහාකාශ්‍යප මහරහතන් වහන්සේ සහ අජාසත් රජතුමා

(ii) පාලි භාෂාවෙහි ප්‍රභවය සම්බන්ධයෙන් විවිධ උගතුන් විවිධ මත දක්වා ඇත.

★ මාගධී භාෂාව ලෝකයේ මුල් ම භාෂාව වේ. එය ආදිකල්පික වූ මනුෂ්‍යයන් ද බ්‍රහ්මයන් ද නො අසන ලද කථා හඬ ඇති දරුවන් ද, බුදුවරයන් වහන්සේලා ද කථා කරන භාෂාවයි.

**බුද්ධඝොෂ හිමි**

★ පාලිය මගධ දේශවාසීන් ව්‍යවහාර කළ භාෂාවයි. **ජේම්ස් අල්විස්**

★ පාලිය කලිඟු රටින් ලක්දිවට ගෙන ආ භාෂාවයි. **ඕල්ඩන්බර්ග් පඬිතුමා**

★ පාටලී ශබ්දයෙන් බිඳී ආ පාටලී පුත්‍ර නගරයේ ව්‍යවහෘත භාෂාවයි. **ඊ.ජේ.තෝමස් පඬිතුමා**

★ පාලිය කෝසලයේ රාජ්‍ය භාෂාව විය. **රීස් ඩේවිඩ්ස් පඬිතුමා**

★ පාලිය උජ්ජේනියේ භාෂාව විය. **වැස්ටර්ගාර්ඩ් / කුන් පඬිවරු**

★ අවන්ති දේශයේ ව්‍යවහාරයේ පැවති පෛශාචිය හා සමාන භාෂාවකි. **නලිනාක්ෂ දත් පඬිතුමා**

★ පාලිය බෞද්ධයාගේ සාහිත්‍ය භාෂාවයි. **වින්ටර්නිට්ස් පඬිතුමා**

★ පාලිය අර්ධ මාගධියෙන් සකසා ගත් ශාස්ත්‍රීය භාෂාවකි. **ගෛගර් පඬිතුමා**

★ ලංකාවේ අනුරාධපුර මහාවිහාරික භික්ෂූන් වහන්සේලා විසින් නිර්මාණය කරන ලද භාෂාවකි.

C.H.Z. **වික්‍රමසිංහ**

(iii) සුත්ත :

අර්ථ ප්‍රකාශ කරන නිසා, මනාකොට වදාළ නිසා, අර්ථය උපදවන නිසා, අර්ථය වගුරුවන නිසා, ආර්ය මාර්ගයට පිළිපන් අය මැනවින් රක්නා නිසා, නූලකට සමානව එකිනෙකට බැඳී ඇති නිසා ද **සුත්ත** යැයි කියනු ලැබේ.

විනය :

අනේක විධ වූ විශේෂ නය ඇති හෙයින් ද කාය, වාග් දෙක හික්මවන හෙයින් ද විනයාර්ථ දන්නවුන් විසින් මේ විනය, විනය යැයි පවසන ලදි.

අභිධම්ම :

විශිෂ්ට වූ ද, ගැඹුරු වූ ද, අතිරේක වූ ද ධර්මය අභිධර්මය යි.

(iv) ★ දී ඇති සූත්‍ර නාමාවලිය පරීක්ෂා කොට ලකුණු ප්‍රදානය කරන්න.

**ලකුණු දීමේ ක්‍රමය.**

මෙම ප්‍රශ්නයේ,

(i) කොටසට පිළිතුරු සැපයීමේ දී එක් නමකට එක ලකුණ බැගින් ලකුණු දෙකක් පිරිනමන්න.

(ii) එක් මතයකට ලකුණු දෙක බැගින් ලකුණු 04 ක් පිරිනමන්න.

(iii) පාලියෙන් හෝ සිංහලෙන් ඇති එක් නිර්වචනයකට ලකුණු දෙක බැගින් සලකා ලකුණු 06 ක් පිරිනමන්

(iv) එක් සූත්‍ර නාමයකට එක් ලකුණ බැගින් ලකුණු 08 ක් පිරිනමන්න.

4. (i) කථාවත්ථුප්පකරණයේ කර්තෘවරයා නම් කරන්න.

(ii) අභිධම්ම පිටකයට අයත් ග්‍රන්ථ නම් කරන්න.

(iii) වංසකථා යනු කවරේදැයි කෙටියෙන් හඳුන්වන්න.

(iv) පාලි වංසකථාවලින් ලැබෙන ප්‍රතිලාභ **හතරක්** අදාළ වංසකථාවක් ඇසුරෙන් පෙන්වා දෙන්න.

(ලකුණු 2+4+6+8=20 යි.)

**ආදර්ශ පිළිතුර**

(i) මොග්ගලීපුත්තතිස්ස මහරහතන් වහන්සේ

(ii) 1. ධම්මසඞ්ගණිප්පකරණය 2. විභඞ්ගප්පකරණය 3. ධාතුකථා පකරණය
4. පුග්ගලපඤ්ඤත්ති පකරණය 5. කථාවත්ථුප්පකරණය 6. යමක පකරණය
7. පට්ඨාන පකරණය

(iii) වංස යනු කුලය හෙවත් පරම්පරාවයි. වංස යනු උණ ගසට නමකි. එය පුරුකින් පුරුක එකට සම්බන්ධ වී තිබෙන්නාක් මෙන් වංස යන්නෙන් යමක පරම්පරාවක් හෝ ඉතිහාසයක් පිළිබඳව කිය වේ. යම් පුද්ගලයෙකුගේ හෝ යම් වස්තුවක හෝ පරම්පරා තොරතුරු විස්තර කිරීම වංස කතාවේ කාර්යභාරය වෙයි.

(iv) 1. **ඉතිහාසය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම :**

දීපවංසය, මහාවංසය වැනි වංස කථා කියවීම තුළින් ඉතිහාසය පිළිබඳ මනා අවබෝධයක් ලබා ගත හැකිය.

2. **ආගමික භක්තිය ඇති කිරීම :**

දාඨාවංසය, ලලාටධාතුවංසය, ඡකෙසධාතුවංසය වැනි වංසකථා කියවීම තුළින් ආගමික භක්තිය, ප්‍රසාදය හා සංවේගය ජනනය වෙයි.

3. **උදාර පුද්ගල ගති ස්වභාවයන් චරිතායනය කිරීම :**

ථූපවංසය වැනි වංස කථා කියවීම තුළින් උදාර පුද්ගල ගති ස්වභාවයන් චරිතායනය වෙයි.

4. **ශිලා ලේඛනගත තොරතුරු නිවැරදිව තහවුරු කර ගැනීම :**

දීපවංසය, මහාවංසය වැනි වංස කථා කියවීම තුළින් ශිලා ලේඛනගත තොරතුරු නිවැරදිව තහවුරු කර ගැනීමට හැකි වෙයි.

5. **ඓතිහාසික මූලාශ්‍ර වශයෙන් භාවිතයට ගැනීම :**

දීපවංසය, මහාවංසය, ථූපවංසය, මහා බොධිවංසය වැනි වංස කථා ඓතිහාසික මූලාශ්‍ර වශයෙන් භාවිතයට ගත හැකි වෙයි.

6. කාව්‍ය ලක්ෂණ හඳුනාගත හැකි වීම, ආදී කරුණු.

**ලකුණු දීමේ ක්‍රමය.**

(i) කොටසට ලකුණු ලබා දීමේ දී කතුවරයාගේ නම සඳහන් කොට ඇත්නම් ලකුණු දෙකක් පිරිනමන්න.

(ii) කොටසේ ග්‍රන්ථ හත ම දක්වා ඇත්නම් ලකුණු හතරක් පිරිනමන්න. (එක් ග්‍රන්ථයකට ලකුණු භාගය බැගින්)

(iii) මෙම කරුණු තිබේ නම් ප්‍රමාණවත් පරිදි ලකුණු 06 ක් පිරිනමන්න.

(iv) කොටසේ ප්‍රතිලාභ හතරක් නියෝජනය වන පරිදි පිළිතුරු සපයා තිබිය යුතු අතර එක් කරුණකට ලකුණු දෙක බැගින් ලකුණු 08 ක් පිරිනමන්න.

## III කොටස

05. (i) පහත A තීරුවේ දැක්වෙන පදවලට අදාළ ව්‍යාකරණ ප්‍රවර්ගය B තීරුවෙන් තෝරා ලියා දක්වන්න.

| | A | B |
|---|---|---|
| අ | උදකමාහරිං | ආඛ්‍යාතයකි. |
| ආ | ඣායති | කාරකයකි. |
| ඉ | දෙවෙ ගළන්තම්හි | කිතකයකි. |
| ඊ | නගවිවරං | තුමන්ත ක්‍රියාවකි. |
| උ | නිසින්නො | නාමපදයකි. |
| ඌ | පහඤ්ඤාන | නිපාතයකි. |
| එ | පුථුජ්ජනා | පූර්ව ක්‍රියාවකි. |
| ඒ | පූජෙතුං | රූපකයකි. |
| ඔ | මෙසදුළුහි | සන්ධියකි. |
| ඕ | යදා | සමාසයකි. |

(ii) පහත දැක්වෙන වගුවේ හිස්තැන් ඒකවචන බහුවචන බව ද සැලකිල්ලට ගනිමින් සම්පූර්ණ කරන්න.

| | පඨමා විභත්තිය | තතියා විභත්තිය | චතුත්ථී විභත්තිය |
|---|---|---|---|
| අ | ථෙරො | | |
| ආ | | වාචාය | |
| ඉ | | | පුඤ්ඤානං |
| ඊ | සො | | |
| උ | | | මය්හං |

(iii) පහත දැක්වෙන අර්ථය ගෙන දෙන වචන පාලියෙන් ලියන්න.

(අ) දොළහ (ආ) දහසය (ඉ) දෙවැනි

(ඊ) එකළොස්වැනි (උ) විසිපස් වැනි

(iv) පහත දැක්වෙන ආඛ්‍යාත පදවල තේරුම ලියන්න.

(අ) අගමිංසු (ආ) ගච්ඡෙය්‍යාසි (ඉ) අගමිස්සා

(ඊ) ජගාම (උ) ගච්ඡන්තු

(ලකුණු 5+5+5+5= 20 යි)

05. ආදර්ශ පිළිතුර

(i)

| | A | B |
|---|---|---|
| අ | උදකමාහරිං | සන්ධියකි. |
| ආ | ඛාදයති | ආඛ්‍යාතයකි. |
| ඉ | දෙවෙ ගළන්තම්හි | කාරකයකි. |
| ඊ | නගවිවරං | සමාසයකි. |
| උ | නිසින්නො | කිතකයකි. |
| ඌ | පහත්වාන | පූර්ව ක්‍රියාවකි. |
| එ | පුථුජ්ජනා | නාමපදයකි. |
| ඒ | පූජෙතුං | තුමන්ත ක්‍රියාවකි. |
| ඔ | මෙසඳුනුහි | රූපකයකි/සමාසයකි |
| ඕ | යදා | නිපාතයකි. |

(ii)

| | පඨමා විභත්තිය | තතියා විභත්තිය | චතුත්ථී විභත්තිය |
|---|---|---|---|
| අ | ථෙරො | ථෙරෙන | ථෙරාය, ථෙරස්ස |
| ආ | වාචා | වාචාය | වාචාය |
| ඉ | පුඤ්ඤා,පුඤ්ඤානි | පුඤ්ඤෙහි,පුඤ්ඤෙභි | පුඤ්ඤානං |
| ඊ | සො | තෙන | තස්ස |
| උ | අහං | මයා | මය්හං |

(iii) (අ) දොළහ - ද්වාදස / බාරස (ආ) දහසය - සොළස/ඡදස

(ඉ) දෙවැනි - දුතිය (ඊ) එකළොස්වැනි - එකාදසම

(උ) විසිපස් වැනි - පඤ්චවීසතිම

(iv) (අ) අගමිංසු - ගියහ (ආ) ගච්ඡෙය්‍යාසි - යන්නෙහි නම්

(ඉ) අගමිස්සා - ගියේ නම් (ඊ) ජගාම - ගියේල/ගියේලු

(උ) ගච්ඡන්තු - යෙත්වා

**ලකුණු දීමේ ක්‍රමය.**

මෙම ප්‍රශ්නයේ,

(i) කොටසේ නිවැරදි පිළිතුරකට ලකුණු භාගය බැගින් ලකුණු 05 ක් පිරිනමන්න.

(ii) කොටසේ නිවැරදි පිළිතුරු දෙකකට එක ලකුණ බැගින් ලකුණු 05 ක් පිරිනමන්න.

(iii) කොටසේ නිවැරදි පිළිතුරකට ලකුණු එක බැගින් ලකුණු 05 ක් පිරිනමන්න.

(iv) කොටසේ නිවැරදි පිළිතුරකට ලකුණ එක බැගින් ලකුණ 05 ක් පිරිනමන්න.

**6.** (i) "ධම්මෙන මාතා පිතරො භරෙය්‍ය - පයොජයෙ ධම්මිකං සො වණිජ්ජං,
එතං ගිහිං වත්තයං අප්පමත්තො - සයංපභෙ නාම උපෙති දෙවං." මෙම ගාථාවෙහි තේරුම ලියා දක්වන්න.

(ii) පුද්ගල ආත්ම සංයමය සඳහා ධම්මපදයේ 'අත්ත වර්ගය' දක්වන බුද්ධෝපදේශ **පහක්** හඳුන්වා දෙන්න.

(iii) බෝසතාණන් වහන්සේගේ මානව හිතවාදී චර්යාව නිර්දිෂ්ට ජාතක කථාවල එන නිදසුන් **පහක්වත්** ගෙනහැර දක්වමින් පහදා දෙන්න.

(iv) ථේරීගාථාවෙහි පුණ්ණා දාසිය හා බ්‍රාහ්මණයා අතර ඇති වන සංවාදය කෙටියෙන් දක්වා, එයින් ඉස්මතු වන ආගමික සංකල්ප පිළිබඳ විවරණයක් කරන්න.

(ලකුණු 5+5+5+5 =20යි.)

ආදර්ශ පිළිතුර

(i) හෙතෙම දැහැමින් මව්පියන් පෝෂණය කරන්නේ නම්, දැහැමි වෙළඳාම් කරන්නේ නම්, ගිහිවත් සපුරන්නා වූ අප්‍රමාදී තැනැත්තේ ස්වයං ප්‍රභ නම් දේවත්වයට එළඹෙයි.

(ii)
- ★ නුවණැත්තා යාම තුනෙන් එක් යාමයක දී තමාගේ ජීවිතය සුරක්ෂිත කරගන්නා බව
- ★ නුවණැත්තා පළමුව තමාගේ ජීවිතය සකස් කොට ඉක්බිති අනුන්ට අවවාද කරන බව
- ★ තමාගේ ආරක්ෂකයා තමා ම යැයි සිතා ක්‍රියා කරන්නා දුර්ලභ වූ පිහිටක් ලබන බව
- ★ තමා විසින් කළ, තමාගෙන් ම හටගත් පාපය තමා ම විනාශයට පමුණුවන බව
- ★ ආර්යයන්ගේ අනුශාසනය නො පිළිගන්නා තැනැත්තා විනාශයට පත් වෙන බව
- ★ තමා කළ පාපයෙන් තමා කිළිටි වන්නාසේ ම තමා නො කළ පාපයෙන් තමා පිරිසිදු භාවයට පත් වෙන බව
- ★ පරාර්ථය වැඩිපුර කළත් එයින් තමාගේ ස්වාර්ථය නැති කර නො ගත යුතු බව

(iii) බෝසතාණන් වහන්සේගේ මානව හිතවාදී චර්යා **පහක්**

තැනට සුදුසු නුවණ, වීර්යවන්ත බව, අව්‍යාජ බව, පරාර්ථකාමිත්වය, මානව දයාව, සත්ව කරුණාව, උපායශීලී බව, කළමනාකරණයේ දූරදර්ශී බව, උගත්කම, යුක්තිය පසිඳලීම සඳහා යොදා ගැනීම යනාදී කරුණුවලින් පහක් අදාල ජාතක කතාවක් ඇසුරින් නිදසුන් සහිතව පහදා තිබිය යුතුය.

(iv) ථේරීගාථාවෙහි පුණ්ණා දාසිය හා උදක ශුද්ධික සොත්‍රීය බමුණා අතර මෙම සංවාදය සිදු වේ.

පුණ්ණා : මම ගෙහිමියන්ගේ දඬුවමට හා බැණුමට බියෙන් සැමදා සීතල දරා ගෙන දියට බැස දිය ගෙන යමි. ඒත් නුඹ කවරෙකුට බියෙන් සීතලේ දියට බැස නාන්නේ ද ?

බ්‍රාහ්මණයා : පුණ්ණාවනි, යම් මහල්ලෙක් හෝ දරුවෙක් හෝ පාප කර්මයක් කරයි ද හෙතෙම මෙසේ දිය නෑමෙන් පිරිසිදු බවට පත් වෙයි.

පුණ්ණා : කවර නම් මෝඩයෙන් මෝඩ වූ ඔබට දිය නෑමෙන් පවෙන් මිදේ යැයි කීවේ ද ? දියෙහි බැස සිටීමෙන් පව් නැසේ නම් ජලජ ජීවීහු ඒකාන්තයෙන් ස්වර්ගයට යන්නෝ ය. දියෙහි බැස නෑමෙන් පව් පාකර හැරියේ නම් ඔබේ පින් ද පාකර යාවි. එවිට ඔබ පව්වලින් මෙන් ම පින්වලින් දසපුරා බැහැර වූ තැනැත්තෙක් වන්නේය.

බ්‍රාහ්මණයා : පින්වතිය, වැරදි මගට පිළිපන් මා ආර්යමාර්ගයට පැමිණවීය. ඔබ මේ සළුව ගන්න.

පුණ්ණා : ඔය සළුව නුඹ ම ගන්න. එය මට එපා. නුඹ දුකට කැමති නැත්නම් එළිපිට හෝ රහසින් හෝ පව් නො කරන්න. බුදුන්, දහම්, සඟුන් සරණ යන්න. එය ඔබට පිහිට පිණිස පවතී.

ආගමික සංකල්පය - මෙම සංවාදයෙන් ඉස්මතු වන්නේ බෞද්ධ හා හින්දු ආගමික කර්ම සිද්ධාන්තයයි.

**ලකුණු දීමේ ක්‍රමය.**

මෙම ප්‍රශ්නයේ,

(i) කොටසට ලකුණු ලබා දීමේ දී ගාථාවෙහි නිවැරදි තේරුමට ලකුණු 05 ක් පිරිනමන්න.

(ii) නිවැරදි එක් උපදේශයකට එක් ලකුණ බැගින් ලකුණු 05 ක් පිරිනමන්න.

(iii) නිදසුනක් සහිත එක් මානව හිතවාදී චර්යාවක් එක ලකුණ බැගින් ලකුණු 05 ක් පිරිනමන්න.

(iv) දෙදෙනා අතර ඇති වූ සංවාදයට ලකුණු 03 ක් ද, ආගමික සංකල්ප සඳහා ලකුණු 02 ක් ද වශයෙන් ලකුණු 05 ක් පිරිනමන්න. සංවාදයේ අන්තර්ගතය විස්තර කර ඇති නම් ලකුණු ලබා දෙන්න.

★ ★ ★ ★ ★ ★ ★ ★ ★ ★